දැන්වීමයි

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අයත් III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2019

OPEN/LIMITED COMPETITIVE EXAMINATION FOR RECRUITMENT OF NON-TECHNICAL MANAGEMENT ASSISTANTS OF CATEGORY 2 FOR THE DEPARTMENT OF SOCIAL WELFARE , PROBATION & CHILDCARE PROTECTION OF THE SOUTHERN PROVINCIAL PUBLIC SERVICE - 2019

**** විශේෂයෙන් සැලකිය යුතුයි ****

මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ දී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) හරහා අනිවාර්යයෙන්ම ලියාපදිංචි වී අයදුම් කළ යුතුය.

1.0 අංක 261 හා 2016.05.10 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද හා 2017.03.29 හා 2018.08.01 දිනයන්හිදී කරන ලද සංශෝධනවලට අනුකූලව දකුණු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අයත් III ශ්‍රේණියේ පහත පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් දකුණු පළාතේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2019.03.29 දින වන අතර මෙම විභාගය 2019 මැයි මස ගාල්ල නගරයේදී පවත්වනු ලබයි. පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි වේ.

අ.අ	තනතුරු නාමය	තනතුරු නාමය ඉංග්‍රීසියෙන්	පුරප්පාඩු සංඛ්‍යාව
01	සහකාර මේට්‍රන්	Assistant Matron	8
02	සහකාර වෝර්ඩන්	Assistant Warden	1
03	නිවාස මාතා	House Mother	14
04	පෙර පාසල් ගුරු	Pre School Teacher	1
05	වෘත්තීය උපදේශක	Vocational Instructor	3
06	පුහුණු ගුරු	Trained Teacher	2
07	සාත්තු සේවිකා	Saththu Sevika	2
08	සංඥා භාෂා පරිවර්තක	Signal Language Translator	3

2.0 බඳවා ගන්නා ආකාරය :

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙළ අනුව සුදුසුකම් සපුරා ඇති විවෘත අයදුම්කරුවන් දිස්ත්‍රික් අනුපාතය අනුව බඳවා ගැනීම සිදු කෙරේ. පෙර පාසල් ගුරු, පුහුණු ගුරු, සංඥා භාෂා පරිවර්තක තනතුරු සඳහා 100% ක් විවෘත ධාරාව යටතේ බඳවා ගන්නා අතර, සහකාර මේට්‍රන්, සහකාර වෝර්ඩන්, නිවාස මාතා, වෘත්තීය උපදේශක, සාත්තු සේවිකා යන තනතුරු සඳහා 50% ක් සීමිත ධාරාව යටතේ සහ 50%ක් විවෘත ධාරාව යටතේ බඳවා ගැනේ. විවෘත අයදුම්කරුවන්ගෙන් 50% ක් නොමැති වූ විට එම පුරප්පාඩු ප්‍රමාණය සීමිත අයදුම්කරුවන්ගෙන්ද, සීමිත අයදුම්කරුවන් 50% ක් නොමැති වූ විට එම පුරප්පාඩු ප්‍රමාණය විවෘත අයදුම්කරුවන්ගෙන්ද සම්පූර්ණ කරනු ලබන අතර, බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

- ❖ ලිඛිත විභාගය සමත් වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර, සුදුසුකම් පරීක්ෂා කර බඳවා ගනු ලැබේ.
- ❖ සහකාර වෝර්ඩන් , සහකාර මේට්‍රන් තනතුරු සඳහා පිරිමි ළමා රැඳවුම් නිවාස හා පිරිමි සහතික කළ පාසල් සඳහා පිරිමි අයදුම්කරුවන් පමණක් බඳවා ගන්නා අතර , රජයේ භාර ගැනීමේ ළමා නිවාස, ගැහැනු ළමා රැඳවුම් නිවාස හා කාන්තා සහතික කළ පාසල් සඳහා කාන්තා අයදුම්කරුවන්ගෙන් පමණක් බඳවා ගැනීම සිදු කෙරේ.
- ❖ පෙර පාසල් ගුරු හා නිවාස මාතා තනතුරු සඳහා කාන්තා අයදුම්කරුවන්ගෙන් පමණක් බඳවා ගැනීම සිදුකෙරේ.
- ❖ සාත්තු සේවිකා තනතුර සඳහා කාන්තා අයදුම්කරුවන්ගෙන් 50%ක් හා පිරිමි අයදුම්කරුවන්ගෙන් 50%ක් බැගින් බඳවා ගැනීම සිදුකෙරේ.

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD. ALL RIGHTS RESERVED.

3.0 වැටුප : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අදාළ වැටුප් කාණ්ඩය MN1- 2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 27,100-10x300-11x350-10x495-10x660-45,540 වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව 2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා අදාළ වනුයේ රු. 24,336.00 ක මූලික වැටුපක් හා රු.1502.00 ක ගැළපුම් දීමනාවකි.

4.0 මෙම තනතුර ස්ථිර තනතුරකි. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.

5.0 සුදුසුකම් :- දකුණු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අයත් III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම සම්පූර්ණ කළ යුතු වේ.

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. සෑම අපේක්ෂකයකුම දකුණු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට **"පූර්වාසන්න වසර 03ක කාලය තුළ අයදුම්කරුගේ ස්ථිර පදිංචිය හෝ පූර්වාසන්න වසර 03ක කාලය තුළ කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සමග අයදුම්කරුගේ එක් වසරක ස්ථිර පදිංචිය"** සනාථ කළ යුතුය. පදිංචිය සනාථ කළ යුත්තේ සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කිරීම මගින් විය යුතු ය.

(අ). මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඡන්දහිමි නාම ලේඛන උද්ධෘතය හා

(ආ). ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචි සහතිකය.

IV. **වයස :** විවෘත අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු වන අතර , දැනට පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ යෙදී සිටින්නන්ට වයස් සීමාව අදාළ නොවේ.

V. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ප්‍රථම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

6.0 විවෘත අයදුම්කරුවන්

6.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) සිංහල /දෙමළ/ඉංග්‍රීසි භාෂාව , ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙ.) විභාගය සමත්වී තිබීම.

(ආ) අ.පො.ස.(උ.පෙ.) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම.

6.2 වෘත්තිය සුදුසුකම් : (විවෘත)

අ.අ	තනතුරු නාමය	වෘත්තිය සුදුසුකම්
01	සහකාර මේට්‍රන්	රජයේ ළමා රැකවරණ මධ්‍යස්ථානවල පරිවාස කාලය අවසන් වීමට ප්‍රථම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ආයතනයක හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක ළමා සංවර්ධනය, ළමා ආරක්ෂණය/ළමා රැකවරණය /ළමා සුරැකුම්/දිවා සුරැකුම්, සමාජ වැඩ, පෝෂණවේදය, උපදේශනය යන විෂයයන් වලින් එකක් පිළිබඳ NVQ 3 මට්ටමට සමාන හෝ ඊට ඉහළ මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා ගත යුතු අතර, රිදියගම රජයේ නිවර්තන නිවාසයේ සහ වැලිවිටිය දිවිතුර රැකවරණ මධ්‍යස්ථානයේ පරිවාස කාලය අවසන් වීමට ප්‍රථම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ආයතනයක් හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වන වැඩිහිටි සත්කාරය (Eldercare training), සමාජ වැඩ, පෝෂණවේදය, උපදේශනය යන විෂයයන්වලින් එකක් පිළිබඳ NVQ 3 මට්ටමට සමාන හෝ ඊට ඉහළ මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා ගත යුතුය. (බඳවා ගන්නා අවස්ථාව වන විටත් උක්ත විෂයයකට අදාළව පාඨමාලාවක් හදාරා නියමිත මට්ටමේ සහතිකයක් ලබා සිටින අයදුම්කරුවන් බඳවා ගැනීමෙන් අනතුරුව එම පාඨමාලාවක් හැදෑරීම අවශ්‍ය නොවේ.)
02	සහකාර වෝර්ඩන්	
03	නිවාස මාතා	රජයේ ළමා රැකවරණ මධ්‍යස්ථානවල පරිවාස කාලය අවසන් වීමට ප්‍රථම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ආයතනයක හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක ළමා සංවර්ධනය, ළමා ආරක්ෂණය/ළමා රැකවරණය /ළමා සුරැකුම්/දිවා සුරැකුම්, සමාජ වැඩ, පෝෂණවේදය, උපදේශනය යන විෂයයන් වලින් එකක් පිළිබඳ NVQ 3 මට්ටමට සමාන හෝ ඊට ඉහළ මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා ගත යුතු වේ. .(බඳවා ගන්නා අවස්ථාව වන විටත් උක්ත විෂයයකට අදාළව පාඨමාලාවක් හදාරා නියමිත මට්ටමේ සහතිකයක් ලබා සිටින අයදුම්කරුවන් බඳවා ගැනීමෙන් අනතුරුව එම පාඨමාලාවක් හැදෑරීම අවශ්‍ය නොවේ.)
04	වෘත්තීය උපදේශක	අදාළ වෘත්තීය සම්බන්ධයෙන් නිවේදනයෙහි අනු අංක 08 හි සඳහන් පරිදි පූර්ණකාලීන පාඨමාලාවක් හදාරා ලබා ගත් සහතිකයක් තිබීම.
05	පෙර පාසල් ගුරු	පූර්ව ළමාවිය සංවර්ධනය හෝ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ රජය පිළිගත් ආයතනයකින් වසරක ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර ලබාගත් සහතිකයක් තිබීම.
06	පුහුණු ගුරු	අදාළ නොවේ
07	සාත්තු සේවිකා	පිළිගත් ආයතනයකින් සාත්තු සේවය හෝ හෙද සේවය පිළිබඳ මාස හයකට නොඅඩු පාඨමාලාවක් හදාරා ලබා ගත් සහතිකයක් තිබීම.
08	සංඥා භාෂා පරිවර්තක	රජයේ ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වන සංඥා භාෂා පරිවර්තනය පිළිබඳ වසරක ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය.

6.3 පළපුරුද්ද : (විවෘත)

අ.අ	තනතුරු නාමය	පළපුරුද්ද
01	සහකාර මේට්‍රන්	අදාළ නොවේ
02	සහකාර වෝර්ඩන්	
03	නිවාස මාතා	
04	වෘත්තීය උපදේශක	රාජ්‍ය , අර්ධ රාජ්‍ය හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වසරකට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්ද තිබීම.
05	පුහුණු ගුරු	රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක ගුරු වෘත්තියේ යෙදී ලබාගත් වසරකට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්ද තිබීම.
06	පෙර පාසල් ගුරු	01. ලියාපදිංචි පෙර පාසලක /පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක පෙර පාසල් ගුරුවරියක ලෙස වසරකට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්ද තිබීම හෝ 02. දකුණු පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ළදරු උයනක වසරකට නොඅඩු කාලයක අඛණ්ඩ සේවා පළපුරුද්ද තිබීම.
07	සාත්තු සේවිකා	රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතනයක හෝ දකුණු පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද වැඩිහිටි නිවාසයක සාත්තු සේවය හෝ හෙද සේවය පිළිබඳ මාස හයක අඛණ්ඩ සේවා පළපුරුද්ද තිබීම.
08	සංඥා භාෂා පරිවර්තක	අදාළ නොවේ

7.0 සීමිත අයදුම්කරුවන්

7.1 අධ්‍යාපන සුදුසුකම් :

සිංහල /දෙමළ/ඉංග්‍රීසි භාෂාව , ගණිතය යන විෂයයන් දෙකට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙ.) විභාගය සමත් වී තිබීම.

7.2 වෘත්තිය සුදුසුකම් : (සීමිත)

අ.අ	තනතුරු නාමය	වෘත්තිය සුදුසුකම්
01	සහකාර මේට්‍රන්	රජයේ ළමා රැකවරණ මධ්‍යස්ථානවල පරිවාස කාලය අවසන් වීමට ප්‍රථම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ආයතනයක් හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වන ළමා සංවර්ධනය, ළමා ආරක්ෂණය/ළමා රැකවරණය /ළමා සුරැකුම්/දිවා සුරැකුම්, සමාජ වැඩ, පෝෂණවේදය ,උපදේශනය යන විෂයයන් වලින් එකක් පිළිබඳ NVQ 3 මට්ටමට සමාන හෝ ඊට ඉහළ මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා ගත යුතු අතර, රිදියගම රජයේ නිවර්තන නිවාසයේ සහ වැලිවිටිය දිවිතුර රැකවරණ මධ්‍යස්ථානයේ පරිවාස කාලය අවසන් වීමට ප්‍රථම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ආයතනයක් හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වන වැඩිහිටි සත්කාරය (Eldercare training) ,සමාජ වැඩ ,පෝෂණවේදය ,උපදේශනය යන විෂයයන් වලින් එකක් පිළිබඳ NVQ 3 මට්ටමට සමාන හෝ ඊට ඉහළ මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා ගත යුතුය. (බඳවා ගන්නා අවස්ථාව වන විටත් උක්ත විෂයයකට අදාළව පාඨමාලාවක් හදාරා නියමිත මට්ටමේ සහතිකයක් ලබා සිටින අයදුම්කරුවන් බඳවා ගැනීමෙන් අනතුරුව එම පාඨමාලාවක් හැදෑරීම අවශ්‍ය නොවේ.)
02	සහකාර වෝර්ඩන්	
03	නිවාස මාතා	අදාළ නොවේ
04	වෘත්තීය උපදේශක	අදාළ වෘත්තීය සම්බන්ධයෙන් නිවේදනයෙහි අනු අංක 08 හි සඳහන් පරිදි පූර්ණකාලීන පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකයක් තිබීම.
05	පෙර පාසල් ගුරු	අදාළ නොවේ.
06	පුහුණු ගුරු	අදාළ නොවේ.
07	සාත්තු සේවිකා	පිළිගත් ආයතනයකින් සාත්තු සේවය හෝ හෙද සේවය පිළිබඳ මාස හයකට නොඅඩු පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකයක් තිබීම.
08	සංඥා භාෂා පරිවර්තක	අදාළ නොවේ

7.3 පළපුරුද්ද : (සීමිත)

අ.අ	තනතුරු නාමය	පළපුරුද්ද
01	සහකාර මේට්‍රන්	දකුණු පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික සේවා ගණයේ (ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය) දෙපාර්තමේන්තුගත තනතුරක හෝ තනතුරු කිහිපයක වසර පහකට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාල සීමාවට අදාළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
02	සහකාර වෝර්ඩන්	
03	නිවාස මාතා	
04	වෘත්තීය උපදේශක	
05	පෙර පාසල් ගුරු	
06	පුහුණු ගුරු	
07	සාත්තු සේවිකා	
08	සංඥා භාෂා පරිවර්තක	

8.0 වෘත්තිය උපදේශක තනතුර සඳහා හදාරා තිබිය යුතු පාඨමාලා

(අ) විදුලි වෘත්තිය පිළිබඳ උපදේශක

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතනයක විදුලි වෘත්තිය පිළිබඳ වසරකට නොඅඩු පූර්ණකාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

(ආ) වෙල්ඩින්/ලෝහ වැඩ වෘත්තිය පිළිබඳ උපදේශක

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතනයක වෙල්ඩින් වෘත්තිය පිළිබඳ වසරකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

(ඇ) බේකරි නිෂ්පාදන පිළිබඳ වෘත්තිය උපදේශක

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයක හෝ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ හෝ ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතනයක බේකරි නිෂ්පාදනය පිළිබඳ වසරකට නොඅඩු පූර්ණකාලීන පාඨමාලාවක් හදාරා NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

9.0 විභාග පරිපාටිය :-

සිංහල/ දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9.1 විභාගය/වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර සහ විෂයය නිර්දේශය :

තනතුර	ප්‍රශ්න පත්‍රය /විෂයය ක්ෂේත්‍රය	කාලය	මුළු ලකුණු
සහකාර මේට්‍රන්, සහකාර වෝර්ඩන්, පුහුණු ගුරු, වෘත්තීය උපදේශක, සාත්තු සේවිකා, සංඥා භාෂා පරිවර්තක	1. අභියෝගතා පරීක්ෂණය	පැය1 1/2	100
	2. සාමාන්‍ය දැනීම	පැය 02	100
පෙර පාසල් ගුරු, නිවාස මාතා	1. විෂයානුබද්ධ අධ්‍යයනය	පැය1 1/2	100

තනතුර	ප්‍රශ්න පත්‍රය	විෂයය නිර්දේශය
සහකාර මේට්‍රන් / සහකාර වෝර්ඩන්/ පුහුණු ගුරු / වෘත්තීය උපදේශක සාත්තු සේවිකා / සංඥා භාෂා පරිවර්තක	1. අභියෝගතාවය	අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි.
	2. සාමාන්‍ය දැනීම	ජාතික හා ජාත්‍යන්තර, සමාජ, ආර්ථික, දේශපාලන හා කාලීන තොරතුරු ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.
පෙර පාසල් ගුරු	1. විෂයානුබද්ධ අධ්‍යයනය	පහත සඳහන් විෂයය නිර්දේශ අනුව සකස් කෙරෙන බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. • ළදරු හා ළමා වියේ දරුවන්ගේ යහපත් මානසික වර්ධනය සඳහා කළ යුතු හා නොකළ යුතු කරුණු පිළිබඳ සාමාන්‍ය දැනුම • යහපත් ළමා ක්‍රියාකාරකම් හා කුසලතා වර්ධනය කිරීම • ළදරුවන්ගේ මූලික අධ්‍යාපන ක්‍රමවේද පිළිබඳ අවබෝධය • පූර්ව ළමා විය සංවර්ධනය පිළිබඳ දැනුම • ළදරුවන්ගේ ආරක්ෂාව හා රැකවරණය සැලසීම පිළිබඳ ක්‍රමවේද
නිවාස මාතා	1. විෂයානුබද්ධ අධ්‍යයනය	පහත සඳහන් විෂයය නිර්දේශය අනුව සකස් කරන බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. • ළදරුවන්ට ළමුන්ට වැළඳෙන රෝග, සරල ප්‍රථමාධාර, එම රෝග වළක්වා ගැනීම සඳහා පිළිපැදිය යුතු සෞඛ්‍ය ආරක්ෂක ක්‍රම • ළදරු හා ළමා වියේ දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා හා ආහාර ලබා දීමේ දී අනුගමනය කළ යුතු සෞඛ්‍ය පුරුදු • ළදරු හා ළමා වියේ දරුවන්ගේ යහපත් මානසික වර්ධනය සඳහා කළ යුතු හා නොකළ යුතු කරුණු පිළිබඳ සාමාන්‍ය දැනුම

පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් (40%) බැගින්වත් අපේක්ෂකයින් විසින් ලකුණු ලබාගත යුතුවන අතර, වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම ලබා දෙනු ලැබේ. ලිඛිත විභාගයේ ප්‍රතිඵල සියලුම අයදුම්කරුවන් වෙත මෙම කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා නිකුත් කරනු ඇත.

10.0 විභාග ගාස්තු:-

විභාග ගාස්තුව රු. 400/- කි. මෙම මුදල දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් වූ ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළග තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, තැපැල් හෝ උප තැපැල් කාර්යාලවලට ගෙවන ලද මුදල් ද භාරගනු නොලැබේ.

11.0 අයදුම්පත්‍ර

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) හරහා අන්තර්ජාලය හරහා අනිවාර්යයෙන්ම විභාගය සඳහා ලියාපදිංචි විය යුතු අතර, ඒ 4 (සෙ.මී.21X29) (සාමාන්‍ය භාවිත) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින් අයදුම්පත්‍රයෙහි දෘඪ පිටපතක් (Hard Copy) 2019 මාර්තු මස 29 දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. එම දෘඪ පිටපත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"දකුණු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයට අයත් තනතුරුවල III වැනි ශ්‍රේණිය බඳවා ගැනීමේ විවෘත / සීමිත තරග විභාගය - 2019 .... (තනතුර සඳහන් කරන්න) .... දිස්ත්‍රික්කය"** යන්න සඳහන් කරන්න.

ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය, ගාල්ල.

11.1 අන්තර්ජාලය හරහා විභාගය සඳහා ලියාපදිංචි වීමේදී සෑම අයදුම්කරුවෙකු සතුව වලංගු ජාතික හැඳුනුම්පතක්, ඔබගේ හෝ ඔබට තොරතුරු සැපයීමට හැකි ළඟම පුරවැසියෙකුගේ සක්‍රිය ජංගම දුරකථන අංකයක් හා විභාග ගාස්තු ගෙවූ රිසිට්පතද තිබීම අත්‍යවශ්‍ය වේ. විභාගය පිළිබඳ සියලුම තොරතුරු පසුව දැනුම් දෙනු ලබන්නේ ඔබ විසින් සපයන ලද ජංගම දුරකතන අංකය හරහා වේ. විභාගය සඳහා ලියාපදිංචි වීමෙන් අනතුරුව ලැබෙන නියමිත අයදුම්පත්‍රයට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් අනිවාර්යෙන්ම ළඟ තබා ගත යුතුවේ. විභාගය සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සියලු උපදෙස් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (www.psc.sp.gov.lk) මගින් ලබා ගත හැකි අතර, එහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගෙන එහි සඳහන් නීති රීති මැනවින් අනුගමනය කිරීම ඔබ සතු වගකීමකි.

11.2 නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ සෑම අයිතම ම සම්පූර්ණ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවිය හරහා ප්‍රවේශ පත්‍රය නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD. ALL RIGHTS RESERVED.

11.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු, වාර්ෂික වැටුප රු. 240,360/- ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

12. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. තවද, අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු රියදුරු බලපත්‍රය

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk හරහා නිකුත් කළ වහාම ඒ බව ඔබ විසින් දෙනු ලබන ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් මගින් දැනුම් දෙනු ලබන අතර, ඔබ විසින් එම ප්‍රවේශ පත්‍රයේ දෘඪ පිටපතක් (Hard Copy) ලබා ගත යුතුය. විභාගය පැවැත්වීමට නියමිත දිනට දින 07 කට කලින් විභාග ප්‍රවේශපත්‍ර ලබා ගැනීමට නොහැකි වූ අපේක්ෂකයින් පහත සඳහන් විස්තර ඇතිව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දුරකථන අංක 091-2234309 / 0912248450 ඔස්සේ දැන්විය යුතුය.

I. විභාගයේ නම
II. අයදුම්කරුගේ සම්පූර්ණ නම
III. සම්පූර්ණ ලිපිනය
IV. ඉල්ලුම්පත් තැපැල් කළ කාර්යාලය හා ලියාපදිංචි කළ අංකය හා දිනය
V. විභාගය සඳහා ලියාපදිංචි වූ දිනය

13. තෝරා ගැනීමේ ක්‍රමය

මෙම තනතුරු සඳහා ඉහත දක්වා ඇති පරීක්ෂණවලින් දක්වන ලද කුසලතාවය හා රා.ප.ච.15/90 හි සඳහන් විධිවිධාන හා දිස්ත්‍රික් ජනගහන අනුපාතයට අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. (පත්වීම් ප්‍රදානයේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දිය යුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙකු සිටින අවස්ථාවකදී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යාපන සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙළින් තෝරා ගැනේ.) යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

13.1 රා.ප.ච.15/90 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේදී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයන් අතුරින් ඉහළ ම ලකුණු ලබාගත් 3%ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් 50%ක් වත් විය යුතු ය. පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂකයකු විශේෂඥ වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධ සහිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතු ය. මේ අනුව, ඔබගේ ආබාධිත තත්ත්වය සනාථ කළ හැකි ලිපි අයදුම්පත්‍රයට ඇමිණිය යුතු ය.

13.2 සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව සෑම අයදුම්කරුවෙකුටම විභාගයට ඉදිරිපත්වීම සඳහා අවස්ථාව ලබාදෙනු ලැබේ. විභාග ප්‍රතිඵල මත කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අයදුම්පත් කැඳවන අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

14.0 සාවද්‍ය තොරතුරු සැපයීම

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද, අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

15.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

යූ.සී. විදුර කාරියවසම්
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 මාර්තු මස 06 දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, ගාල්ල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

Source: Dinamina (2019.03.08)